සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයः |
|---|

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) සහ (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. මහා වංසයේ අර්ථ විවරණය කිරීම සඳහා පාළි භාෂාවෙන් රචනා කරන ලද ටීකාව හඳුන්වන්නේ කුමන නමින්ද ?

(1) උත්තර විහාරට්ඨ කතා (2) දීප වංසය
(3) විනයට්ඨ කතා (4) වංසත්ථප්පකාසිනි

02. කෝට්ටේ රාජ්‍යය සමයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා තොරතුරු හැදෑරීමේදී වඩාත් වැදගත් සාහිත්‍ය මූලාශ්‍රය ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) සංදේශ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය හා හටන් කාව්‍යය
(2) ප්‍රශස්ති කාව්‍ය, සංදේශ කාව්‍ය හා සෙල්ලිපි
(3) හටන්කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, විදේශීය මූලාශ්‍ර
(4) විදේශ මූලාශ්‍ර, පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර, ප්‍රශස්ති කාව්‍යය

03. A තීරුවේ දක්වෙන්නේ ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි විදේශ මූලාශ්‍ර අයත් රටවල් ය. B තීරුවේ ඊට අදාළ පුද්ගලයන් දක්වා ඇත. තීරු දෙක අදාළ පරිදි ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| A | | B |
|---|---|---|
| ඕලන්ද මූලාශ්‍රය | A | පාහියන් හිමිගේ දේශාටන වාර්තා |
| පෘතුග්‍රීසි මූලාශ්‍රය | B | රොබට් නොක්ස්ගේ එදා හෙළදිව |
| චීන මූලාශ්‍රය | C | පිලිප්පස් බැල්ඩියස්ගේ කෘතිය |
| ඉංග්‍රීසි මූලාශ්‍රය | D | රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය |

(1) ABCD (2) CDAB (3) BCAD (4) DABD

04. මෙරට රචනා වූ පැරණිතම සෙල්ලිපි වර්ගය කුමක් ද?

(1) ගිරි ලිපි (2) ටැම්ලිපි (3) ලෙන් ලිපි (4) අභිලේඛන

05. මීට වසර 38000 ට පෙර ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ වාසස්ථානයක් ලෙස පැවති බවට කාල නිර්ණය කළ ලෙන් ජනාවාසයක් වන්නේ මින් කුමක් ද?

(1) අත්තනගොඩ අළු ලෙන (2) කිතුල්ගල බෙලිලෙන
(3) කුරුවිට බටදොඹ ලෙන (4) බුලත්සිංහල පාහියන්ගල

06. ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ පැවති අභිචාර විධි සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමේ දි වඩාත් වැදගත් වන්නේ,

(1) නිවාස ඉදිකිරීමයි. (2) ආහාර රටාවයි.
(3) මිනී වැළලීමේ ක්‍රමයයි. (4) තාක්ෂණ භාවිතයයි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

07. පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාව පිළිබඳව අධ්‍යයනයේදී තොරතුරු ලබාගත හැකි ස්ථානයක් ලෙස සැලකෙන්නේ මින් කුමන ස්ථානයක් ද?

(1) උඩරංචාමඩම (2) ඉබ්බන්කටුව (3) ගලේවෙල (4) හල්දුම්මුල්ල

08. මුල් ඓතිහාසික යුගයේ ගම්වල ඇතිවන ගැටළු දසගම් ඇත්තන් නමින් හඳුන්වන මණ්ඩලයකින් විසඳූ බව සඳහන් වන ශිලාලේඛනය මින් කුමක් ද?

(1) බුද්ධන්නේහෙල සෙල්ලිපිය (2) කළුදියපොකුණ සෙල්ලිපිය
(3) අනුරාධපුර පුවරු ලිපිය (4) වේවැල්කැටිය සෙල්ලිපිය

09. පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ රජතුමා වන්නේ මින් කවුරුන් ද?

* ප්‍රාදේශීය පාලකයන් කීපදෙනෙකු සමග සටන් කර ඒ ප්‍රදේශ තමන් යටතට ගැනීම.
* අනුරාධපුරය සිය අගනුවර ලෙස තෝරාගැනීම.
* තම දසවෙනි රාජ වර්ෂයේදී ග්‍රාමසීමා ලකුණු කිරීම.

(1) වළගම්බා රජතුමා (2) පණ්ඩුකාභය රජතුමා
(3) දේවානම් පියතිස්ස රජතුමා (4) දුටුගැමුණු රජතුමා

10. පියාගෙන් පුතාට රාජ්‍යත්වය හිමිවීම සම්බන්ධයෙන් දියහැකි හොඳම උදාහරණය සඳහන් පිළිතුර තෝරන්න.

(1) දුටුගැමුණු රජතුමාගෙන් සද්ධාතිස්ස රජුට රජකම හිමිවීම.
(2) යසලාලක තිස්ස රජුගෙන් සුභ රජුට රජකම හිමිවීම.
(3) වසභගෙන් පසු වංකනාසික තිස්ස රජුට රජකම හිමිවීම.
(4) දේවානම් පියතිස්ස රජුගෙන් පසු උත්තිය රජුට රජකම හිමිවීම.

11. චක්‍රවර්තී රාජ්‍ය සංකල්පය භාවිතා කළ පාලකයෙකු වන්නේ,

(1) මහසෙන් රජතුමා ය. (2) නිශ්ශංකමල්ල රජතුමා ය.
(3) කාශ්‍යප රජතුමා ය. (4) කුටකණ්ණ අභය රජතුමා ය.

12. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වූ පසු ගොඩනැගුන රාජ්‍ය පරිපාලන තන්ත්‍රයේ නිලධාරීන් හා ඔවුන්ගේ කාර්යභාරයන් A සහ B ලෙස දක්වා ඇත. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| A | | B | |
|---|---|---|---|
| 1. | රූප අදෙක | A | වෙළඳ කටයුතු භාර ප්‍රධානියා |
| 2. | නට අදෙක | B | කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානී |
| 3. | නගර වුඩික | C | නාට්‍ය අංශයේ ප්‍රධානී |
| 4. | පන අදෙක | D | නගරයේ වාස්තු විද්‍යාඥයා |

(1) BCDA (2) CADB (3) ACBD (4) CABD

13. ක්‍රි.ව. 9 වන සියවසේ ලියවුන සෙල්ලිපිවල ව්‍යවස්ථාදායකය හා විධායකය හඳුන්වා තිබුනේ කුමන ආකාරයට ද?

(1) එක්තැන්සමිය (2) සභාව (3) මහලේ (4) රාජසභාව

- A බුද්ධදාස රජතුමා B උපසග්ග රෝගනාසා
  C IV කාශ්‍යප රජතුමා D පසවන්ති නාමසාලා

14. ඉහත තොරතුරු ඇසුරෙන් උණ රෝගීන් සඳහා ඉදිවූ රෝහල් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) AB (2) AC (3) CB (4) CD

15. පහත සඳහන් වන්නේ අතීත පාලන ක්‍රමයේදී ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වූ රජවරුන් කිහිප දෙනෙකු හා ඔවුන් එලෙස සම්බන්ධතා පැවැත්වූ රාජ්‍යයන් කීපයකි. එම කරුණු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | | B | |
|---|---|---|---|
| 1. | I වන ගජබා | A | රෝමය |
| 2. | භාතිකාභය රජු | B | චීනය |
| 3. | හයවන අග්ගබෝධි රජු | C | කාලිංග |
| 4. | I වන විජයබා රජු | D | චේර රාජ්‍යය |

(1) ABDC (2) DABC (3) BCDA (4) ADBC

16. මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේගිරිය දේවාලය අසලින් සොයාගත් සෙල්ලිපියක ''දටික'' යන වචනයෙන් අර්ථ දක්වා ඇත්තේ එකල පැවති කුමන කර්මාන්තයක් පිළිබඳවද?

(1) තඹ කර්මාන්තය (2) යකඩ කර්මාන්තය

(3) ඇත්දත් කර්මාන්තය (4) රෙදි විවීමේ කර්මාන්තය

17. මැටි බඳුන් උසස් ලෙස තැනීමට අවශ්‍ය තාක්ෂණය දියුණු වූයේ කුමන යුගයේ සිටද?

(1) දඩයම් යුගය (2) ප්‍රාග් ඓතිහාසික යුගය

(3) පූර්ව ඓතිහාසික යුගය (4) මුල් ඓතිහාසික යුගය

18. ''දියකැට පහන'', ''මොහොල'' යන යෙදුම් භාවිතා වන්නේ වැවක කුමන අංගයක් සම්බන්ධයෙන් ද?

(1) රළපනාව (2) සොරොව්ව (3) වැව් බැම්ම (4) බිසෝකොටුව

19. මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ යන වැව් වලට ජලය ගෙන යාමට ඉදිකළ ඇළ මාර්ගය කුමක් ද?

(1) යෝධ ඇළ (2) රිදීබැඳි ඇළ (3) මිනිපේ ඇළ (4) ඇළහැර ඇළ

20. මෙම ඡායාරූපයේ දක්වෙන නිර්මාණය



(1) මැටි මුද්‍රාවකි.

(2) හස් එබූ කාසියකි.

(3) මධ්‍යකාලීන රං කහවණුවකි.

(4) තඹ මස්සකි.

21. ''මහවිනිවහි ලබනක වටිති'' සිතුල්පවුව විහාරයේ වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය සපයාගැනිමට පූජා කරමින් සිතුල්පව්ව ලිපිය පිහිටවූ රජතුමා කවුරුන් ද?

(1) I ගජබාහු රජතුමා (2) නිශ්ශංකමල්ල රජතුමා

(3) I විජයබාහු රජතුමා (4) සිරිමේඝවර්ණ රජතුමා

22. ඓතිහාසික සමාජ සංවිධානයේ ප්‍රභූවරුන්ගේ මට්ටමට පහළින් සිටි සාමාන්‍ය ජනතාව සෙල්ලිපි වලින් හඳුන්වා දුන්නේ කුමන නමින් ද?

(1) දාසයන් (2) කුඩීන් (3) එඬේරුන් (4) ගොවියන්

23. අතීත සමාජයේ නීති හා සම්ප්‍රදායන් ක්‍රියාත්මක වීමේදී බදු වශයෙන් රජයට ගෙවිය යුතු වූයේ නිෂ්පාදනයෙන් කොපමණ ප්‍රමාණයක් ද?

(1) හතරෙන් එකක් (2) හයෙන් එකක් (3) පහෙන් එකක් (4) දෙකෙන් එකකි

24. අතීත ශ්‍රී ලංකාවේ වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අයකළ බදු වර්ගය වන්නේ,

(1) දකපති (2) බොජකපති (3) මතරමජිබක (4) කැතිඅඩ

25. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණ ලක්ෂණ පෙන්නුම් කරන නගර දෙක අයත් පිළිතුර වන්නේ මින් කවරක් ද?

(1) අනුරාධපුරය හා දඹදෙණිය (2) අනුරාධපුරය හා මාගම

(3) පොළොන්නරුව හා මාගම (4) කෝට්ටේ හා අනුරාධපුරය

- **පහත වගුව ඇසුරු කරගනිමින් 26 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A සේනාසම්මත වික්‍රමබාහු රජු | D දඹදෙණිය | G කෝට්ටේ IV පැරකුම් රජු |
| B පොළොන්නරුව | E II පැරකුම් රජු | H ජයවීර බණ්ඩාර |
| C වන්නි විජයබාහු රජු | F ලීලාවතී | I සුගලා |

26. මෙරටදී තුන්වරක් බලයට පත් වූ පාණ්ඩ්‍ය වංශික රජ බිසව සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු වන්නේ,

(1) B හා F ය. (2) B හා I ය. (3) D හා B ය. (4) D හා I ය.

27. බෙලිගල ප්‍රදේශයේ ඉදි වූ දළදා මාළිගය සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු වන්නේ,

(1) D හා F ය. (2) C හා D ය. (3) A හා B ය. (4) B හා C ය.

28. ඉහත තොරතුරු ඇසුරින් උඩරට ප්‍රදේශය කේන්ද්‍රකරගත පළමුවරට ස්වාධීන පාලනයක් ගොඩනැගූ පුද්ගලයා කවුරුන් ද?
(1) ජයවීර බණ්ඩාර (2) සේනාසම්මත වික්‍රමබාහු
(3) වන්නි විජයබාහු (4) පැරකුම් රජුය.

29. පහත සඳහන් වන්නේ උඩරට රජවරු පෘතුගීසින් සමග සටන් ඇතිකරගත් ස්ථාන කීපයකි. එම සටන්වලට නායකත්වය දුන් සෙන්පතියන් කවුදැයි A, B ගළපා තෝරන්න.

| A | | B | |
|---|---|---|---|
| 1. | දන්තුරේ | A | දොන් ජෙරනිමෝද අසවේදු |
| 2. | රන්දෙනිවෙල | B | දියෝගෝද මේලෝ කැස්ත්‍රෝ |
| 3. | ගන්නොරුව | C | කොන්ස්තන්තීනුද සා |
| 4. | බලන | D | පේරෝ ලෝපෙස් ද සූසා |

(1) ABCD (2) BCDA (3) CDAB (4) DCBA

30. වර්තමාන සියම් නිකායේ ආරම්භය සිදුවූයේ උඩරට රාජ්‍යය කළ කුමන රජතුමාගේ කාලයේ ද?
(1) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (2) කීර්ති ශ්‍රී රාජසිංහ
(3) පළවෙනි විමලධර්මසූරිය (4) ශ්‍රී විජය රාජසිංහ

31. උඩරට රාජධානියේ බද්දේ සංවිධානය යටතේ ක්‍රියාත්මක වූ හැඳ බද්ද යටතේ සිදුකළේ කුමන කාර්ය කොටස ද?
(1) රෙදි සේදීම (2) රෙදි වියීම (3) ඇතුන් ඇල්ලීම (4) ප්‍රවාහන කටයුතු

- **පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ / පද යුගල අධ්‍යයනය කර 32 සිට 34 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 1. වළං තැනීම
2. බඩහැල බද්ද

B 1. ලතින් භාෂාව
2. ආගමික කටයුතු හා නීතිය හැදෑරීම

C 1. විලියම් ෂේක්ස්පියර්
2. ලෝරාට සැහැලි කවි

D 1. විජයබා කොල්ලය
2. කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදී යාම

32. දෙවැන්න සඳහා පළමුවැන්න උපයෝගීකරගත් බව දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

33. දෙවැන්න මගින් පළමුවැන්න සිදු වූ බව දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

34. පළමුවැන්න, දෙවැන්න සිදුවීමට හේතු වූ බව දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

35. කලා ශිල්ප අතර නෙළීමේ කලාවට ද පුනරුද සමයේ වැදගත් තැනක් හිමි විය. ප්‍රතිමා නෙළීමේදී මෙකල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) කළුගලේ ප්‍රතිමා නෙළීම (2) ලී වල ප්‍රතිමා නෙළීම
(3) කිරිගරුඬින් ප්‍රතිමා නෙළීම (4) ලෝහවල ප්‍රතිමා නෙළීම

36. ඉතාලියේ නව චිත්‍ර කලාවක් බිහිකළ නගරය වූයේ කුමක් ද?
(1) වැනීසිය (2) නේපල්ස් (3) ජිනෝවා (4) ප්ලෝරන්ස්

- **පහත දැක්වෙන A හා B යටතේ දැක්වෙන තොරතුරු ඇසුරෙන් 37 හා 38 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහය වීමට එකඟ වීම.

B ඇතුන් හැර උඩරට සෙසු වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීම පිළිබඳ ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලැබීම.

37. 1638 උඩරට ලන්දේසී ගිවිසුමේ මූලික කරුණු සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍යවේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

38. කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා ලන්දේසීන් සමග 1766 වසරේ ඇති වූ ගිවිසුම සම්බන්ධයෙන්
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍යවේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

39. මධ්‍යතන යුගය වන විට ආසියානු වෙළඳාමේ ඒකාධිකාරිය හිමි වූයේ කුමන ජාතියට ද?
(1) පෘතුගීසි (2) ලන්දේසි (3) මුස්ලිම් (4) ඉංග්‍රීසි

40. 1764 වර්ෂයේ දී උඩරට ආක්‍රමණ කළ ලන්දේසි ආණ්ඩුකාරවරයා කවුරුන් ද?
(1) ජොරිස් වැන් ස්පිල්බර්ජන් (2) බැරන් වැන් එක්
(3) සීබල් ද වර්ට් (4) වෙස්ටර්වල්ඩ්

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය | **ඉතිහාසය - II** | කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4 ක් ද, **III** කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කොට නම් කරන්න.

(i) මාගම, අනුරාධපුරය, දඹදෙණිය, දැදුරුඔය, නිල්වලා ගඟ, යෝධවැව, බලන, මහකනදරා වැව, මඩකලපුව, ඌරාතොට, බටදොඹලෙන, ඇළහැර අමුණ (ලකුණු 12)

(ii) ජපන් දූපත්, මලක්කා සමුද්‍ර සන්ධිය, කැලිකට්, රතු මුහුද, රෝමය, පර්සියන් බොක්ක (ලකුණු 06)

(ආ) (i) පහත සඳහන් A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් හෝ ස්ථාන අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියාදක්වන්න.

A බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය නම් දේශාටන වාර්තාව ලියූ චීන හිමියන්

B I වන විජයබා රජු විසින් බුදල්නාවන්ට ලබාදුන් දීමනාවක් පිළිබඳ තොරතුරු සඳහන් තඹ සන්නස.

C කාලයක් අතහැර දමා යළිත් වගා අරඹන හේන් හැඳින්වීමට අනුරපුර වැසියෝ භාවිතා කළ නම

D මෙරටට පැමිණි මුල්ම පෘතුගීසි කණ්ඩායමේ නායකත්වය ගත් තැනැත්තා (ලකුණු 04)

(ii) පහත A, B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A



1. ඡායාරූපය හඳුනාගෙන නම් කරන්න.
2. මෙම කැටයම දැක ගත හැකි ස්ථානය කුමක් ද?
3. මෙය කුමන යුගයකට අයත් ද?
4. මෙම කැටයමින් නිරූපණය වන්නේ කවුරුන් ද?

(ලකුණු 04)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) (1) ඡායාරූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?

(2) මෙය හමු වූ ස්ථානය කුමක් ද?

(3) මෙය නිර්මිත මාධ්‍ය කුමක් ද?

(4) මෙහි ක්‍රියාකාරීත්වයට භාවිතා කළ විද්‍යාත්මක මූලධර්මය කුමක් ද?

(ලකුණු 04)

B



---

## II - කොටස

(01) (i) මහා වංසය රචනා කිරීමට ආභාසය ලබාගත් මූලාශ්‍රය කෘති තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) රජරට ශිෂ්ටාචාරය හැදෑරීමට ඇති ධර්ම ග්‍රන්ථ 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදාගැනීමේ දී සැලකිල්ලක් දක්විය යුතු කරුණු 2 ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ඉතිහාසය හැදෑරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රවලින් ඇති ප්‍රයෝජන 3 ක් දක්වා ඒ පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

(02) (i) පහත සඳහන් වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් ජීවත් වූ වාසස්ථාන කීපයකි. ඒවා අතරින් පහත රට තෙත් කලාපීය ලෙන් ජනාවාස 3 ක් තෝරා ලියන්න.

* මිනිහාගල්කන්ද
* පාහියන්ගල
* බෙල්ලන්බැඳි පැලැස්ස
* බටදොඹ ලෙන
* සීගිරියේ පොතාන
* කිතුල්ගල බෙලිලෙන
* බුන්දල

(ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් නිපදවාගත් ක්ෂුද්‍ර ශිලා මෙවලම් වලින් ඔවුන් ලබාගත් ප්‍රයෝජන 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික මානවයා මිනී වැළලීම සම්බන්ධ අභිචාර විධි අනුගමනය කළ බවට සාධක හමුවන ස්ථාන 2 ක් නම් කර එම ස්ථානවල අනුගමනය කළ අභිචාර විධීන් මොනවාදැයි වෙන් වෙන්ව විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර හඳුනාගැනීමට හැකි සාධක 3 ක් නම් කර ඒ පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) පූර්ව රාජ්‍ය සමයේ දී මෙරට පාලන කටයුතුවලට සම්බන්ධ වූ පාලකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) මුළු රටම ඒකීය රාජ්‍යයක් ලෙස පාලනය කරන ආකාරය ජාත්‍යන්තරයට පෙන්වීම සඳහා දේවානම් පියතිස්ස රජතුමා ගන්නා ලද ක්‍රියාමාර්ග 2 ක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) අතීත රජවරුන් ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කටයුත්ත ලෙස කෘෂිකාර්මික කටයුතු සිදු වූ ප්‍රධාන අංශ තුන නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) ලාංකිකයන් ව්‍යවහාරික විද්‍යාවේ මූලධර්මයන් භාවිතයට ගෙන නිර්මාණ කිරීම පරිණත තත්වයට පත් වූයේ පූර්ව ඓතිහාසික යුගයේදී ය. එලෙස විද්‍යාත්මක අදහස්වල ස්වරූපය පෙන්නුම් කරන නිර්මාණ 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අතීත වාස්තු ශිල්පීන් ගෘහනිර්මාණ කිරීමේ දී විද්‍යාත්මක ආදේශනය යොදාගත් ආකාරය රුවන්වැලි සෑයේ ඉදිකිරීම් 2 ක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) සමාජයේ යහපත් බව ආරක්ෂා කිරීමට ඉතා පුරාණ කාලයේ සිට අපේ නැණවත් පාලකයෝ නීතිය හා සම්ප්‍රදායන් අනුගමනය කළහ. එලෙස අතීත පාලකයෝ සොරකම මිනීමැරීම වැනි අපරාධ සම්බන්ධයෙන් පනවන ලද නීතිරීති මොනවාදැයි දක්වා ඒ පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලංකාවේ පාලකයින් පරිසරයේ තිබෙන ස්වභාවික නොඉඳුල් ගුණය ආරක්ෂා කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයට අයත් නගර පරිහානියට හා බිඳවැටීමට බල පෑ හේතු සාධක 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) (A) හා (B) සිදුවීම් සම්බන්ධ පාලන මධ්‍යස්ථානය හා පාලකයා වරහන් තුළින් තෝරා පිළිවෙලින් නම් කරන්න.

(A) කාලිංග මාඝගෙන් රජරට මුදවා ගැනීම.

(B) පන්සිය පනස් ජාතක කතා පොත සිංහලයට පරිවර්තනය කිරීම.

(II පැරකුම් රජු, පොළොන්නරු යුගය, I විජයබාහු රජතුමා, දඹදෙණි යුගය, කුරුණෑගල යුගය, IV පැරකුම් රජතුමා) (ලකුණු 04)

(iii) පළමු නාගරීකරණයට සාපේක්ෂව දෙවන නාගරීකරණ අවධියේ දී ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා වෙළඳාම යන ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන නාගරීකරණ සමයේ භාෂාව හා සාහිත්‍යය යන අංශවල විශාල ප්‍රබෝධයක් ඇතිවීමට බලපෑ සාධක තුනක් නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) උඩරට රාජධානිය හඳුන්වන ලද වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) පළමුවන විමලධර්මසූරිය රජතුමා තම රාජ්‍යත්වයේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග 04 නම් කරන්න. (ලකුණු 04)

(iii) නායක්කර් වංශික රජෙක් වුවද කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකිරීමට ක්‍රියාකළ ආකාරය කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) (a) මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු හා සම්බන්ධ ප්‍රධාන පරිපාලන අංශ 03 ක් නම් කරන්න.

(b) ඉන් එක් අංශයක ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) යුරෝපීයයන් ආසියාවට පැමිණීමේ අරමුණු 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) උඩරට රාජධානිය ආක්‍රමණය කළ පෘතුගීසි සෙන්පතියන් හතර දෙනෙක් A, B, C හා D ලෙස පහතින් දක්වා ඇත. ඔවුන් හා සටන් වැදුණු උඩරට පාලකයින් කවුරුන්දැයි A, B, C හා D අනුපිළිවෙලින් ලියාදක්වන්න.

A පේරෝලෝපේස් ද සූසා

B දොන් ජෙරනිමෝ ද අසවේදූ

C කොන්ස්තන්තිනූ ද සා

D දියෝගෝ ද මේලෝ (ලකුණු 04)

(iii) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපීපෙනෙන ලක්ෂණ 2 ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මෙරටින් උපරිම ආර්ථික වාසි ලබාගැනීමේ අරමුණින් ලන්දේසීන් ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්තියේ කැපීපෙනෙන ලක්‍ෂණ තුනක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III - කොටස

(08) (i) කතෝලික සභාව විවේචනය වීම පුනරුද යුගයේ සිදු වූ වැදගත් සිදුවීමකි. එසේ පල්ලිය විවේචනය කළ පහත සඳහන් පුද්ගලයින්ගේ මව් රටවල් A, B, හා C අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 03)

A ජෝන් වයික්ලිප් B ඉරාස්මස් C මාර්ටින් ලූතර්

(ii) (a) පුනරුද සමයේ ශාස්ත්‍රීය පුනරුදය යටතේ ප්‍රබෝධයට පත් ක්‍ෂේත්‍ර දෙකක් නම් කරන්න.

(b) පුනරුද සමයේ දියුණුවට පත් ගෘහනිර්මාණ කලාවේ ප්‍රධාන ලක්‍ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මානවවාදී අදහස් ප්‍රචලිත වීමත් සමග යුරෝපයේ සිදු වූ වෙනස්කම් දෙකක් කෙටියෙන් හඳුවන්න. (ලකුණු 05)

(iv) මධ්‍යතන යුගයට සාපේක්‍ෂව පුනරුද යුගයේ දී භාෂාව හා සාහිත්‍ය ක්‍ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(09) (i) පුනරුද සමයේ ඇති වූ විද්‍යාවේ දියුණුවත් සමග විශ්වය පිළිබඳ මත ඉදිරිපත් කළ තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පුනරුද සමයේ දේශ ගවේෂණයේ යෙදුන පහත සඳහන් පුද්ගලයන් සොයාගත් ප්‍රදේශ A, B, C, D පිළිවෙලින් ලියා දක්වන්න.

A බර්තොලමියු ඩයස්

B වස්කෝද ගාමා

C ක්‍රිස්ටෝපර් කොලොම්බස්

D පර්ඩිනන්ඩ් මැගලන් (ලකුණු 04)

(iii) නව මුහුදු මාර්ග සොයා යාමේ ගමන සාර්ථක වීම සඳහා ඒවන විට යුරෝපයේ සකස් වෙමින් පැවති පරිසරය බලපෑවේ කෙසේදැයි කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පුනරුදයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i)
(01) (***a***) (i)
(01) (அ) (i)



(01) (අ) (ii)
(01) (*a*) (ii)
(01) (அ) (ii)




**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(1) | 3 -(2) | 4 -(3) | 5 -(4) | 6 -(3) | 7 -(1) | 8 -(2) | 9 -(2) | 10 -(3) |
| 11-(2) | 12 -(1) | 13 -(1) | 14 -(3) | 15 -(2) | 16 -(3) | 17 -(3) | 18 -(2) | 19 -(4) | 20 -(2) |
| 21-(1) | 22 -(2) | 23 -(2) | 24 -(1) | 25 -(2) | 26 -(1) | 27 -(2) | 28 -(2) | 29 -(4) | 30 -(2) |
| 31-(2) | 32 -(2) | 33 -(1) | 34 -(4) | 35 -(3) | 36 -(4) | 37 -(1) | 38 -(2) | 39 -(3) | 40 -(2) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) (අ) (i)




(ii)



## I - කොටස

(01) (ආ) (i) A පාහියන් හිමි
B පනාකඩුව තඹ සන්නස
C කනත්ත
D ලොරෙන්සෝද අල්මේදා (ලකුණු 04)

(ii) 1. මිනිසා හා අශ්ව හිස
2. ඉසුරුමුණි විහාරය
3. අනුරාධපුර යුගය
4. වැස්සට අධිපති දෙවියන් වන අග්නි හා පර්ජන්‍යය (ලකුණු 04)

(iii) 1. ලෝකඩ ඇත් පහන
2. කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දැදිගම කොටවෙහෙර
3. ලෝකඩ
4. ස්ථිතික ජල විද්‍යා මූලධර්මය (ලකුණු 04)

## II - කොටස

(01) (i) උත්තර විහාරට්ඨ කතා / විනයට්ඨ කතා / සීහලට්ඨ කතා / දීප වංසය (ලකුණු 03)

(ii) බෝධිවංසය, ථූපවංසය, ධාතුවංසය, පූජාවලිය, සද්ධර්මාලංකාරය (4 ක් ලිවීමට ලකුණු 04)

(iii) මූලාශ්‍රය රචනා වූ කාලය / මූලාශ්‍රයේ කතුවරයා / කතුවරයාගේ අරමුණ / මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය (2 ක් දක්වා විස්තර කරන්න. ලකුණු 05)

(iv) * ඓතිහාසික කාල අනුපිළිවෙල සකස් කරගත හැකි වීම.
* එක් එක් අවධිවල දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබාගැනීමට.
* එක් මූලාශ්‍රයක තොරතුරු තවත් මූලාශ්‍රයක් මගින් තහවුරු කර ගැනීම.
* රටක විදේශ සබඳතා අධ්‍යයනය කිරීමට (ලකුණු 06)

(02) (i) පාහියන්ගල / බටදොඹ ලෙන / කිතුල්ගල බෙලි ලෙන (ලකුණු 03)

(ii) කැපීම / තැලීම / සීරීම / හැරීම විස්තර කිරීම අවශයයි. (ලකුණු 05)

(iii) * දෙකට බෙදෙන ලෙස සිදුරු විදින ලද හිස් කබල් - රාවනා ඇල්ල
* රළුවට පිහිටි දාර ගලක ඉලීම හා එක පැත්තක ගුරු ගල් ආලේප කිරීම - පාහියන්ගල
* ඇටසැකිලි නමා මකුටුකර වළ දමා නැවත ගොඩට ගෙන නැවත තැන්පත් කිරීම - කුරුවිට බටදොඹ ලෙන (කිතුල්ගල බෙලිලෙන - පොතාන ආදී ස්ථානවල තොරතුරු) (ලකුණු 05)

(iv) පිළිස්සූ මැටි වළං භාවිතය / ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම / ගල් මෙවලම් වෙනුවට යකඩ ලෝහය භාවිත කිරීම (මෙම කරුණු විස්තර කරන්න. ලකුණු 06)

(03) (i) ගෘහපති / ගමික / පරුමක (ලකුණු 03)

(ii) * ජයසිරිමා බෝධි රෝපන උත්සවයට කතරගම හා ඡන්දනගම ක්‍ෂත්‍රියන්ට ආරාධනා කිරීම.
* ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම. (ලකුණු 04)

(iii) බුද්ධදාස රජතුමා - රෝහල් ඉදිකිරීම, වෛද්‍යවරයෙකු ලෙස කටයුතු කිරීම, රෝහල් ඉදිකිරීම, වෛද්‍යවරු පත් කිරීම, රෝහල් වලට ගම්වර ප්‍රදානය, රජවරුන් වෛද්‍ය සේවයේ යෙදීම

V වන මහින්ද රජතුමා - රෝහල්වලට අවශ්‍ය පහසුකම් සැලසීම

දුටුගැමුණු රජතුමා - රෝහල් 20ක් ඉදිකිරීම.

IV වන කාශ්‍යප රජතුමා - උණ රෝගීන් සඳහා විශේෂ රෝහලක් ඉදිකිරීම (පැහැදිලි කරන්න.) (ලකුණු 05)

(iv) හේන් ගොවිතැන / (වී ගොවිතැන) මඩගොවිතැන / සත්ත්ව පාලනය

මෙම ආර්ථික කටයුතු සිදු වූ බවට පුරාවිද්‍යාත්මක හා සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් තොරතුරු අසුරෙන් විස්තර කර තිබීම. (බුත්සරණ, උම්මංග ජාතකය, IV කාශ්‍යප රජුගේ සෙල්ලිපිය, නාගපබ්බත විහාරයේ මහාමේරු ගල වැනි)

04 (i) 1. මැටි ඔරු සුසාන
2. සීගිරි ජල මල්
3. දැදිගම ඇත් පහන (ලකුණු 03)

(ii) * රුවන්වැලි සෑයට අකුණු වැදීම වැළැක්වීමට අකුණු සන්නායක සවිකිරීම (වජ්‍ර චුම්බට)
* රුවන්වැලි සෑයේ අත්තිවාරම ඉදිකිරීම සඳහා නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමවේදයක් භාවිතා කිරීම. (ලකුණු 04)

(iii) 4 වන මිහිඳු රජුගේ වේවැල්කැටිය ශිලා ලිපියේ සොරකම් කිරීමට හා මිනිමැරීමට දෙන ලද දඬුවම් දක්වා තිබේ.
මිනිමැරීමට - එල්ලා මැරීම
සොරකම් කිරීමට - සතුන්ගේ ශරීරවල තබා ඇති මුද්‍රාව රත්කොට සොරකම් කළ අයගේ නළලේ තැබීම

(iv) IV වන මිහිඳු - අනුරපුර පුවරු ලිපියේ උස්බිම්වල කැළෑ නොකැපිය යුතු බව
3 වන උදය - බුද්ධන්නේහෙල - කැළෑවල ගස් කොලන් නොකැපිය යුතු බව
5 වන කාශ්‍යප - කොණ්ඩවට්ටවාන් ලිපිය - ගස් කොලන් කළමනාකරණයේදී රජය විසින් පනවන නීතිරීතිවලට සකසන නිවේදන අනුව වැඩකළ යුතු බව

(05) (i) සතුරු ආක්‍රමණ, මධ්‍යගත පාලනය බිඳ වැටීම, ආරක්ෂාව නැති වීම, වෙළඳාම හා ගමනාගමන කටයුතු අඩපන වීම, ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම.

(ii) (a) දඹදෙණි - II පැරකුම් රජු
(b) කුරුණෑගල - IV පැරකුම් රජු

(iii) කෘෂිකර්මය
* වැව් වාරිමාර්ග සෑදීමට අවධානය යොමු නොකිරීම.
* අහස් දියෙන් වගා කිරීම, ජල හිඟ ප්‍රදේශවල හේන් වගාව, කඳුකර ප්‍රදේශවල හෙල්මළු ක්‍රමයට වගා කිරීම ප්‍රධාන අර්ථ ක්‍රමය කෘෂිකර්මයයි.

වෙළඳාම
* අතිරික්ත නිෂ්පාදන වෙළඳම් කිරීම.
* විදේශ සබඳතා පුළුල් වීම.
* තෙත් කලාපයේ වැවෙන කුළුබඩු වර්ග රැස්කර විකිණීම.
* වාණිජ ආර්ථිකයකට යොමු වීම.
* පුවක්, එනසාල්, සාදික්කා, මුතු, මැණික්, ඇතුන් හා ඇත් දළ අපනයනය කිරීම.
* මූලාශ්‍රවල සඳහන් තොරතුරු.

(iv) අධ්‍යාපන මධ්‍යස්ථාන බිහිවීම.
උගතුන් බිහිවීම, උගතුන් ග්‍රන්ථකරණයේ නිරත වීම, ග්‍රන්ථකරණය රාජ්‍ය අනුග්‍රහය ලැබීම, රජවරුන් ග්‍රන්ථකරණයේ නිරත වීම ආදීය ඇසුරෙන් විස්තර කිරීම.

ගිහි පැවිදි උගතුන්
දඹදෙණියේ දෙවන පැරකුම් බොහෝ සාහිත්‍ය පොතපත ලිවේය. එතුමා කලිකාල සර්වඥ පණ්ඩිත යන නමින් ප්‍රකට විය. කව්සිළුමිණ මෙතුමාගේ කෘතියකි. ධර්මසේන හිමියන් පැවිදි උගතෙකි. එතුමාගේ සද්ධර්ම රත්නාවලිය වැදගත් කෘතියකි. මයුරපාද පරිවේණාධිපති හිමි බුද්ධ පුත්‍ර හිමියන් ද පූජාවලිය රචනා කරන ලදී. මෙවැනි උගතුන් බිහිවීමට රාජධානියේ දියුණුවට හේතු විය. තොටගමුවේ රාහුල, ඉරුගල්කුලපති පිරිවෙන් හිමි, කැරගල ...............

ලියවුන සාහිත්‍ය කෘතීන්
පැරකුම්බා සිරිත, කාව්‍ය ශේඛරය, බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍ය, හංස පරෙවි සංදේශසත්ති කාව්‍ය, ගීලෝකාව්‍ය ආදී කෘති විශාල ප්‍රමාණයක් ලියවී ඇත. (ලකුණු 06)

(06) (i) සෙංකඩගල නුවර / මහනුවර රාජධානිය / කන්දෙ නුවර / කන්ද උඩරට පස් රට (ලකුණු 03)

(ii) * කුසුමාසන දේවිය විවාහ කර ගැනීම
* රෝමානු කතෝලික ආගම අතහැර බුදුදහම වැළඳ ගැනීම
* විමලධර්මසූරිය නමින් බෞද්ධ නමක් ලබාගැනීම
* දෙල්ගමු විහාරයේ තිබූ දළදාව මහනුවරට වැඩම කරවීම (ලකුණු 04)

(iii) * සියම් දේශයට දූතයන් යවා උපසම්පදා භික්ෂූන් ගෙන්වා සියම් නිකාය ආරම්භ කරවීම
* උඩරට පහත රට විහාරාරාම ප්‍රතිසංස්කරණය කිරීම
* වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර ලබාදී ආගම් ප්‍රබෝධය ඇතිකරවීම
මින් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහවාසල
* රජවාසලේ කටයුතු පවත්වාගෙන යාම මෙම කාර්යාංශය මගින් සිදුවීම
* මෙම කටයුතු විවිධ නිලධාරීන්ට භාරවීම
* රෙදිපිළි ආභරණ, ගෘහභාණ්ඩ සැපයීම විවිධ නිලධාරීන් අතින් සිදුවීම
* මහ වාසල ඒ ඒ කාර්ය භාරව විවිධ නිලමේවරුද සිටියහ. ඇතුන් භාරව ගජනායක නිලමේ, දියවඩන නිලමේ, සළු වඩන නිලමේ ආදි ලෙස

රටවසම
* උඩරට රාජ්‍ය රට දිසාව යනුවෙන් කොටස්වලට බෙදා පාලනය කිරීම මෙම කාර්යාංශය යටතේ සිදුවිය.
* දිසාවන් භාරව සිටි නිලධාරීන් දිසාව විය
* රට භාරව සිටි අය රටේරාල හෙවත් රටේ මහත්තුරු විය. ඔවුන් මෙන් ලියනරාල උණ්ඩිය රාල වැනි අය වාසය කර ඇත. දිසාවන් කෝරළවලටත් කෝරළ පත්තුවලටත් බෙදා නිලධාරීන් යොදා පාලනය කරන ලදී.

බද්දේ සංවිධානය
දිසාව තුළ පිහිටි ශිල්පීන් හෝ ඔවුන්ගේ කාර්ය අනුව වෙනම සංවිධානය කර තිබුණි. මුල් කාලයේ මෙය වෙනම ක්‍රියාත්මක වුවත් පසුව දිසාව යටතේ ක්‍රියාත්මක විය. මඩිගේ බද්ද කුරුවේ බද්ද, හැද බද්ද ලෙස සංවිධාන සකස්වී තිබුණි. (ලකුණු 06)

(07) (i) ආර්ථික වාසි ලබාගැනීම / ආගම ප්‍රචාරය කිරීම / ජාත්‍යන්තර කීර්තිය දිනාගැනීම (ලකුණු 03)

(ii) A I විමලධර්මසූරිය B I විමලධර්මසූරිය C II වන රාජසිංහ
D II වන රාජසිංහ

(iii)
* ලන්දේසි වෙළඳ සමාගමට පාඩු සිදුවන ගැටුම්වලින් වැලකී උඩරට සමග සාමකාමීව කටයුතු කිරීමට ලන්දේසීන් උත්සාහ දැරීම.
* රජුගේ හිත දිනාගැනීමට රජුට තෑගිබෝග ලබාදීම, රජුට තෑගිබෝග ලබාදීම, රජු හමුවීමට දූත පිරිස් යැවීම, රජු සමග ලිපි හුවමාරු කර ගැනීම, මේ මගින් රජුගේ හිත දිනාගෙන උඩරට වැවෙන කුරුඳු තමන් වෙත ලබාගැනීම
* උපසම්පදාව ගෙනඒම වැනි රජුගේ ආගමික කටයුතුවලට අවශ්‍ය නැව් සපයාදීම

(iv)
* උඩරට රජු වෙනත් විදේශිකයන් සමග වෙළඳ සම්බන්ධතා පැවැත්වීම ලන්දේසීන් හැකිතරම් අවහිර කිරීම.
* රජු සමග මත ගැටුම් ඇති වූ විට උඩරට හා පහතරට කඩවත් වසාදැමීම
* පහතරට ඇතැම් ප්‍රදේශවල වී වගාව දියුණු කිරීමට ලන්දේසීන් කටයුතු කිරීම මේ තුළින් විදේශ වලින් සහල් ආනයනයට යන වියදම් අඩුකිරීම

## III - කොටස

(08) (i) A එංගලන්තය B ප්‍රංශය C ජර්මනියේ (ලකුණු 03)

(ii) (a) භාෂාව, සාහිත්‍ය, කලාශිල්ප
(b) වටකුරු අරුක්කු, උස් කුලුණු, අර්ධ ගෝලාකාර ශිඛර

(iii)
* මිනිසා උසස් කොට සැලකීම්.
* සෑම දෙයක් පිළිබඳ විචාරත්මකව බැලීම.
* මානවාදී විෂයන් ඉගැන්වීමට යොමු වීම.
* මානවවාදී ගත්කතුවරු බිහිවීම.

(iv)
* ග්‍රීක ලතින් භාෂා ප්‍රචලිත වීම.
* ප්‍රාදේශීය භාෂා අභාවයට යාම.
* සාහිත්‍යයේ ප්‍රබෝධයක් ඇති වීම.
* මානව වාදී ගත්කතුවරු බිහි වීම. ඇසුරින් විස්තර කර තිබීම.

(09) (i) නිකලස් කොපර්නිකස් / අයිසෙක් නිව්ටන් / ජොහැන්නස් කෙප්ලර් / ගැලීලියෝ ගැලිලි (ලකුණු 03)

(ii) A කුණාටු තුඩුව - සුභපැත්මේ තුඩුව B කැලිකට්
C බටහිර ඉන්දියානු දූපත් D පිලිපිනය (ලකුණු 04)

(iii)
* නාවික ගමන්වල සුරක්ෂිතව යෙදීමට හැකි මාලිමාව උතුරු තරු මාපකය නිපදවීම
* පුනරුදයේ දී ලෝකය ගෝලාකාර බව සොයාගැනීම
* ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම
* ජාතික රාජ්‍යය මෙම ගමන් සඳහා අනුග්‍රහ දැක්වීම

(ඉහත කරුණු 2 ක් ඔස්සේ පැහැදිලි කරන්න.) (ලකුණු 05)

(iv)
* රාජාණ්ඩු පාලන ක්‍රමය බිඳවැටී පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් දායාද වීම.
* පැරණි දේශීය නිළධාරී පිරිස වෙනුවට නව පාලනයට ගැලපෙන නිලධාරී පන්තියක් නිර්මාණය වීම.
* නව පරිපාලන ආයතන බිහිවීම.
* නව නීතිරීති පද්ධතියක් දායාද වීම.
* යුක්තිය පසිඳලීම සඳහා නව අධිකරණ ක්‍රමයක් හඳුන්වා දීම වැනි කරුණු ඔස්සේ විස්තර කර තිබීම.